**බිංගිරිය ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ මිලදීගත් මල්ටි මීඩියා යන්ත්‍රය සඳහා ණයහිමි රු.200,000 ක් හා ඡායාපිටපත් යන්ත්‍රය සඳහා ණයහිමි රු.40,000 ක් ලෙස ණයහිමියෝ රු.240,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සභාව සතු බවට හඳුනාගෙන තිබූ ඉඩම් 03ක් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර ඉඩම් 04 ක එකතු වටිනාකම රු.400,500 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | එක් ඉඩමක් නිශ්චිතව හඳුනාගත නොහැකි බවත් තවත් ඉඩමක සම්පූර්ණ ඉඩම අක්කර 01 රූඩ් 02 ක ප්‍රමාණයක් වෙන්දේසි කර ඇති බවත් එමඟින් සභාවට පොදු කොටසක් ලැබී නොමැති බවත්, අනෙක් ඉඩම සභාව සතු පොදු ඉඩමක පාරක් බවත් තක්සේරු කමිටුව මඟින් සනාථ කර ඇති බව. | වත්කම් හඳුනාගෙ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.17,092 ක් වූ නොපියවූ අත්තිකාරම් 05 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව නොතිබුණි. | නොසැසඳීම් හඳුනා ගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදි ශේෂ පදනම් කරගෙන ගිණුම් සකස් කළ යුතුය. |
| තැන්පතු ලේඛණයේ තැන්පත් ශේෂ හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂ අතර රු.6,269,357නොසැසඳීම් පැවතුණි. | 2023 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කරන බව. | නිවැරදි ශේෂ ඇතුලත් කර ගිණුම සකස් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | 371 වගන්තිය | සභාව විසින් 2018 ට පෙර ලබාදුන් රු.358,252 වටිනාකමැති අත්තිකාරම් 16ක් පියවීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 571 වගන්තිය | කල් ඉකුත් වූ තැන්පතු රු.1,330,629 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.77,412,376 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.10,348,736 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂ කිහිපයක සිට හඳුනානොගත් රු.181,846ක ශේෂය හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට නොහැකි වූ බව. | අදාළ ශේෂ කඩිනමින් හඳුනා ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2021 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය බිල් කළ ආදායමින් | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය බිල් කළ ආදායමින් |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 4,692 | 1,707 | 3,209 | 179 | 4,602 | 1,707 | 4,923 | 244 |
| කුලී | 20,872 | 6,629 | 14,525 | 118 | 19,594 | 6,353 | 15,098 | 1,846 |
| බලපත්‍ර ගාස්තු | 1,802 | - | 1,564 | - | 1,622 | - | 1,671 | - |
| වෙනත් ආදායම් | 115,603 | - | 84,637 | - | 84,064 | - | 62,085 | - |
| | 142,969 | 8,336 | 103,935 | 297 | 109,882 | 8,060 | 83,777 | 2,090 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අතුරු ව්‍යවස්ථා** | | |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 28 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කිරීමට අදාලව කටයුතු සිදුකරමින් පවතින අතර අනෙකුත් අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පනවා ගැනීමට කටයුතු කරන බව. | සභාවට අදාළව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරිනිය 2020 පෙබරවාරි 19 දින සිට ප්‍රාදේශීය සභාවේ සේවයෙන් නිදහස් කර තිබියදී සන්නිවේදන දීමනා වශයෙන් රු.99,500 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | මෙම නිලධාරිනිය මීතැන්වල ආයුර්වේද රෝහල වෙත අනුයුක්තයක් ලබා ගොස් ඇති බව. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අදාළ මුදල් අයකරගත යුතුය. |
| (ආ) | සභා බලප්‍රදේශයේ වෙන්දේසි ඉඩමක අක්කර 04 රූඩ් 03 පර්චස් 29.1 කින් මාර්ග සඳහා අදාල බිම් ප්‍රමාණය හැර ඉතිරි බිම් ප්‍රමාණය වන පර්චස් 701 න් පොදු කොටස සඳහා ලබාදිය යුතු සියයට 10 ප්‍රමාණය වූ පර්චස් 70.1 වෙනුවට ඔප්පු අංක 8624 මඟින් පර්චස් 64 ක් පමණක් ලබා දී තිබුණ අතර ඒ අනුව පර්චස් 6.1ක් අඩුවෙන් සභාවට ලබා දී තිබුණි. එලෙසම එම ඉඩමේ කෙළවරක ඇති වටිනාකමින් අඩු ඉඩම් කොටසක් පොදු ඉඩම් කොටස ලෙස සභාවට පවරා තිබුණි. | කට්ටි කර විකිණීමේදී සභාවට ලබා දිය යුතු පොදු ඉඩම් කොටසේ ඉතිරි පර්චස් 6.1 සඳහා එම ඉඩම් කොටසේ වටිනාකම ගෙවීමට එම ආයතනය වෙත දැනුවත් කර ඇති බව. | සභාව වෙත ලැබිය යුතු පොදු ඉඩම් ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂය සඳහා ආයතන 19 ක් පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | ආයතන 19 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණු බව. | පරිසර බලපත්‍ර ලබා දීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගිණුම් ශේෂ 06 කට අදාළව ලැබිය යුතු ශේෂය රු.993,578 ක් වූ අතර ඉන් රු.764,557 ක් වසර 5 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයක් විය. | මෙම මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගිණුම් ශේෂ 04 කට අදාළව රු.44,032,341 ක ගෙවිය යුතු ශේෂයක් පැවති අතර ඉන් රු.11,400 ක් වසර 05 කට වඩා පැරණි ශේෂයක් විය. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. |

### 3.3 සේවක ණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය අතහැර ගිය සේවකයෙකුට අදාලව රු.7,500 ක සේවක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අය නොවී පැවතුණි. | සමථ මණ්ඩලය වෙත යොමු කර ඇති බව. | අයවිය යුතු මුදල් අයකර ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු හා සවිකිරීම්වලට අදාලව, සහ යන්ත්‍ර හා උපකරණවලට අදාලව ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර මෝටර් රථවලට අදාලව ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලින කිරීමට පියවර ගන්නා බව. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) | සභාව විසින් නඩත්තු කරන ඉඩම් දේපල 2 ක් සහ පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ වාහන 02 ක් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | ඉතිරි ඉඩම් විධිමත්ව ප්‍රාදේශිය සභාවට පවරා දී නොමැති බැවින් ඒ සඳහා ප්‍රාදේශිය ලේකම්හට ඉල්ලීම් කර ඇති බව. | වත්කම් සභාව වෙත පවරාගත යුතුය. |
| (ඇ) | සභාව සතු ඉඩම් වත්කම් පිළිබඳව විධිමත් පරිදි සමීක්ෂණ සිදුකර නොතිබූ අතර සභාව සතු ඉඩම්වල විධිමත් පරිදි වැට මායිම් ලකුණු කර එම වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | සභාව සතු වත්කම් පිළිබඳව සමීක්ෂණ සිදු කරමින් පවතින බව. | වත්කම්වල ආරක්ෂාව ප්‍රමාණවත් පරිදි තහවුරු කළ යුතුය. |

**3.5 වාහන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.7,175,000 ක වටිනාකමට ගිණුම්වල පෙන්වා තිබූ සභාව සතු වාහන 04 ක් මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | අඩුපාඩු පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ වාහන නිසි පරිදි ලියාපදිංචි කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 03 ක අයවැයගත ආදායම හා සත්‍ය ආදායම අතර විචලතාවයක් සියයට 30 සිට149 දක්වා පරාසයක පැවතුණු අතර වැය විෂයයන් 93 ක අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 60 කට අඩු ප්‍රතිපාදන මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුල වැය දරා තිබුණි. | 2023 වර්ෂයේ නිවැරදිව කටයුතු කරන බව. | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |